ජනාධිපති අරමුදල

# උපදෙස් පත්‍රිකාව

## අ.පො.ස.(උ.පෙළ) හැදෑරීමට ජනාධිපති අරමුදල මඟින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවීම

### සුදුසුකම්

- අයදුම්කරුගේ පවුලේ මාසික ආදායම රු.100,000/- නොඉක්මවිය යුතුය.
- රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක විය යුතුය.
- 2022(2023) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට, 2025 වර්ෂයේදී අ.පො.ස.(උ.පෙළ) හැදෑරීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ලැබ සිටිය යුතුය.

### අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම

- අයදුම්පත්‍රයේ අංක 01 සිට 06 දක්වා කොටස් අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය.
- සෑම විටම නිවැරදිම තොරතුරු ඇතුලත් කල යුතුය.
- කෙටි පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතුය. ඔබ වෙත එවැනි දුරකථන අංකයක් නොමැති නම් ඔවුන්ගේ එකඟතාවය සහිතව පවුලේ ලඟම ඥාතියෙකුගේ / පාසලේ ගුරුවරයකුගේ/ විදුහල්පතිතුමාගේ දුරකථන අංකයක් හෝ ලබා දීමට කටයුතු කල යුතුය.
- අදාළ ප්‍රශ්න සඳහා ලකුණු ලබා දීමද අයදුම්කරු විසින් ම සිදු කල යුතු අතර අදාල ප්‍රතිඵල සත්‍යය බවට විදුහල්පති විසින් සහතික කල යුතුය.
- පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ සහතිකයද, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද (ආදායම් වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවේ) සමඟින් **සම්පූර්ණ කරන ලද අයදුම්පත ඔබ අ.පො.ස.(සා.පෙළ) හදාරන ලද පාසලේ විදුහල්පති වෙත පමණක් භාර දිය යුතුය.**
- විදුහල්පති විසින් පමණක් අදාළ අයදුම්පත්‍ර ලැයිස්තු ගතකොට පාසල අයත් කලාප කාර්යාලය වෙත භාර දිය යුතුය.
- කිසිදු අවස්ථාවක අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත භාර දීම හෝ තැපැල මඟින් යොමු නොකළ යුතුය.

### 01. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය

| | |
|---|---|
| 01.01. පවුලේ වයස 21ට අඩු දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකු හෝ ඊට වැඩිවීම | - ලකුණු 04 |
| 01.02. දෙමව්පියන් දෙදෙනාම අහිමි වීම | - ලකුණු 06 |
| 01.03. දෙමව්පියන් නොමැතිව භාරකරුවෙකු ලඟ සිටීම | - ලකුණු 03 |
| 01.04. දෙමව්පියන්ගෙන් එක් අයෙක් අහිමිවීම | - ලකුණු 02 |
| 01.05. ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවයකදී | - ලකුණු 10 |

(අර්ධ දුබලතාවයක් නම් ලකුණු 05 ක් පමණක් ලබා දෙන්න)

(උපරිම ලකුණු 25 )

සැ.යු. :- දරුවන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්ය. ශාරීරික දුබලතාවයන් පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතුයි.

ජනාධිපති අරමුදල

**02. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ අනිවාර්ය විෂයන් සඳහා**

| | | |
|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | - ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා | (B) | - ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | - ලකුණු 04 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | - ලකුණු 02 |

කාණ්ඩ විෂයයන් සඳහා එක් විෂයයකට ලකුණු 01 බැගින් විෂයයන් 02 ක උපරිමයකට යටත්ව ලකුණු දෙකක් ලබාදිය යුතුය.

(උපරිම ලකුණු 50)

**03. ක්‍රීඩා**

වොලිබෝල්/ දැල්පන්දු/ පාපන්දු/ පැසිපන්දු/ ක්‍රිකට්/ එල්ලේ/ බැඩ්මින්ටන්/ කබඩි / රගර්/ හොකී/ මලල ක්‍රීඩා/ චෙස්/ කැරම්/ ටෙනිස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ මේස පන්දු හෝ වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**04. සෞන්දර්යය හා විෂය සමගාමී ක්‍රියාකාරකම්**

ජාතික භාෂා හා සාහිත්‍ය තරඟ/ විවාද/කථික/නිවේදන/දැනුම මිනුම/ චිත්‍ර / නැටුම්/ වාදනය/ ගායනය/වේදිකා නාට්‍ය/විෂය ප්‍රවීනතා ජයග්‍රහණ / ශිෂ්‍යභට /බාලදක්ෂ / ප්‍රථමාධාර/පරිසර නියමු/වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**05. ශිෂ්‍ය නායකත්වය**

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | - ලකුණු 05 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ ) | - ලකුණු 04 |
| පන්ති නායක | - ලකුණු 02 |

(උපරිම ලකුණු 05)

සැ.යු. :-

• ඉහත 03 සහ 04 හිදී, එකම විෂය සමගාමී කටයුත්තක් සඳහා ජාතික, පළාත් හා කලාප යන මට්ටම් සියල්ලටම ලකුණු ලබා නොදිය යුතුය. ලකුණු දීමේ දී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම ලකුණු මට්ටම් පමණි.

• ඉහත 05 හිදි ලකුණු දීමේ දී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම ලකුණු මට්ටම් පමණි.